# වැලිකඩ සිරගත දිවිය ඇරඹුදා

## සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න




විමුක්ති කොටි සංවිධානයේ සිටි බව සඟවා මම මගේ මව සමඟ වවුනියාව සුභසාධන මධ්‍යස්ථානයෙහි සැඟවී සිටි බවටත්, සී.අයි.ඩී.ය එහිදී මා අත්අඩංගුවට ගත් බවටත් ජනමාධ්‍යවල පලවූ පුවත් මා දැනගත්තේ බොහෝ කලකට පසුවය. එම අසත්‍ය පුවත් පිළිබඳව මා දුක්වූයේ නැත. මම භාරවීම පිළිබඳ සියලු තොරතුරු ඕමන්තේ හිදී ඒ ගැන වූ ලේඛනවල සඳහන්ය. එහෙයින් භාරවූ අයෙකු වෙනුවෙන් සිදුකරනු ලබන නිත්‍යානුකූල ක්‍රියා මාර්ග මා වෙනුවෙන්ද ගනු ඇතැයි යන විශ්වාසයෙන් මම සිටියෙමි.

කොළඹ සී.අයි.ඩී. යෙහි දෙදහස් නවය වසරේ පස් වෙනි මස විසිවන දින සිට එම වසරේ නව වෙනි මස විසි නව වෙනි දින දක්වා ප්‍රශ්න කිරීම සඳහා රඳවා තබා ගෙන සිටි කාලය තුළ විවිධ හේතු මත ප්‍රශ්න කිරීමට එන අය සමඟ මම නතරව උන්නෙමි. ව්‍යාජ විදේශීය රැකියා නියෝජිතයෝ, මුදල් වංචා සිදුකළ අය, කොටි සැකකරුවන් වශයෙන් ලංකාවේ බොහෝ ස්ථානවලින් කැඳවාගෙන පැමිණි පිරිමි සහ කාන්තාවෝ එහි වූහ. මගේ පවුල, විමුක්ති කොටි සංවිධානය, දෙමළ ජනතාව යන වෘත්තයට බැහැරින් වූ විවිධ වර්ගයෙහි මිනිසුන් සමඟ ආශ්‍රය කිරීම සඳහා වන අවස්ථාව මට ලැබුණේ එහිදීය. සමහර අසරණ කාන්තාවෝ පවතින වාතාවරණය හේතුවෙන් චූදිතයන් බවට පත්ව උන්හ. තවත් සමහර කාන්තාවෝ කිසිම බියක් නොමැතිව අපරාධ කිරීම පිළිබඳ හසළ දැනුමක් සහිත අය වූහ. එවැනි අය සමඟ එක් දිනක් ගත කිරීම යුගයක් සේ විය. පැය විසි හතරම අපව සිරකරගෙන සිටි සිර මැදිරියට එළියේ සී.අයි.ඩී. කාන්තාවෝ මුරකාවල් දමා ගෙන උන්හ. වැසිකිළියටත්, නෑමටත් ඔවුහු අප සමඟ පැමිණියහ.

කාන්තාවන් රඳවාගෙන සිටින ස්ථානය හය වෙනි තට්ටුවෙහි සිට හතර වෙනි තට්ටුව දක්වා එක් වරම මාරු කෙරුණි. පිරිමි අය රඳවාගෙන සිටි ස්ථානයෙහිම අප වෙනුවෙන් කම්බි කූඩුවක් වෙනම සකස් කර අපව එහි රඳවා තැබූහ. කිසිම ආවරණයක් රහිත ස්ථානයක කොහොමද සිටින්නේ යැයි සිතූ සමහර කාන්තාවෝ තමන් සතුව තිබූ රෙදි සහ පැදුරු ආදියෙන් ආවරණයක් සාදා ගත්හ. එය නිරීක්ෂණයට ලක්වූ නිලධාරිහූ පසුදින විශාල චිප් බෝඩ් එකක් ගෙනැවිත් වඩාත් හොඳ ආවරණයක් සාදා දුන්හ.

මෙම කරුණ මම මෙහි ලියා තැබීමට හේතුව වන්නේ කාන්තාවන් සිරගෙට ගොස් පැමිණීම යනු අපගේ සමාජයෙහි මහත් අවමානයක් ලෙසින් සලකන නිසාය. ප්‍රශ්න කිරීම සඳහා කැඳවාගෙන ගියත් ඇය අවමානයට ලක්වූ තැනැත්තියක ලෙසින්, ගෞරවය අහිමි වූ කාන්තාවක් වශයෙන් සළකා ඇයව කොන් කරන ඉතාමත් කුරිරු ආකල්ප සහිත මිනිස්සු සමාජයෙහි සිටිති. සටන් බිමේදී කාන්තාවන් ආයුධ අතට ගෙන සටන් කිරීම පිළිගත් සමාජය, සටන් බිමේදී දහස් ගණන් මරණයට පත්වෙද්දී වීරවරියන් ලෙසින් පිළිගත් සමාජය එම කාන්තාවන්ම සිර ගෙයටත්, පුනරුත්ථාපන කඳවුරුවලටත් ගොසින් පැමිණි පසුව ඔවුන්ව පහත් තත්ත්වයට පත්වූවන් ලෙසින් සැළකීම මහත් කුරිරු දෙයකි.

මෙයට වඩා දරුණු ලෙසට දෙමළ ජනයාගේ ගෞරවය සුළඟට ගසා ගෙන යාමට සළස්වා දේශපාලන ප්‍රතිපල බලාපොරොත්තු වන ආත්මාර්ථකාමීන්ද සිටින බව පිළිගත යුතුය. යුද්ධයේ අවසන් අදියරේ දී ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක්වූ සහෝදරියන් පමණක් නොව, අරගලය ආරම්භ වූ කාලයෙහි සිටම කාන්තාවන් විශාල පිරිසක් ලිංගික ප්‍රචණ්ඩත්වයටත්, ලිංගික අඩම්තේට්ටම්වලත් ලක්වූහ. විමුක්තිය උදෙසා සටන් කිරීමට ගිය සංවිධානවල සිටි සමහර අය පවා ලිංගික සීමා උල්ලංඝනය කිරීම් සිදු කළහ. විමුක්ති කොටි සංවිධානයේ පවා ලිංගික අපරාධවලට සම්බන්ධ වූ පිරිමි සාමාජිකයන්ට බොහෝ සටන්කාමීන් ඉදිරියෙහි මරණ දඬුවම ලබාදුන් අවස්ථා ඇත.

අරගලවලට සහ යුද්ධවලට මුහුණ දෙන සමාජවල කා- න්තාවන්ට ජීවිත හානිවලට පමණක් නොව, මෙවැනි ලිංගික වධවේදනාවන්ටද දීර්ඝ කාලයක් තිස්සේ මුහුණ දීමට සිදුව ඇත. එපමණක් නොව, කාන්තාවන් අරගල කිරීම සඳහා පිටත් වෙන අවස්ථාවේදී තම ආත්ම ගරුත්වය ආරක්ෂා කරගන්නා දක්ෂතාවද තමන් තුළ ගින්නක් ලෙසින් දල්වා ගනියි. සටන්කාමී ගැහැණියක් අරගල බිමේ සිටින විට තම ප්‍රාණය පමණක් නොව තම ආත්ම ගරුත්වයද අහිමි විය හැකිය යන අනතුර පිළිබඳව ඇය දැන සිටින්නීය. එහෙත් ජාතියේ පොදු අරමුණක් වෙනුවෙන් ඇය නිර්භීතව සටන් බිමේ සටන් කරන්නීය.

එම කැප කිරීමේ යහපත් ප්‍රතිලාභ භුක්ති විඳීමට කැමැත්තක් දක්වන සමාජය ඔවුන්ගේ අරගලයට පසුව ජීවිතය දෙස බලන්නේ අවඥා සහගතවය. ලිංගික හිංසනයට ලක්වුණු කාන්තාවන්ගේ සිරුරු ප්‍රදර්ශනය කරමින් දේශපාලන බඩ වඩාගැනීම් සිදු කෙරෙයි. අරගලයට දායකත්වය ලබාදී ජීවිතය බේරාගෙන පැමිණි සෑම කාන්තාවක්ම ගරුත්වය විනාශ කරගෙන පැමිණ ඇතැයි යන අදහස පැතිරවීමත් කුමන නින්දා සහගත ක්‍රියාවක්ද?

විමුක්ති අරගල ජීවිතයෙහි ද කුරිරු සිරගෙයි ජීවිතයෙහි ද ගින්නෙන් දැවී තම ගෞරවය ආරක්ෂා කරගත් දහස් ගණන් සටන්කාමීන් මම දනිමි.

කොළඹ දී පැවැත්වුණු සී.අයි.ඩී. පරීක්ෂණය මාස හතරක් දක්වා දිගු විය. මගේ පරීක්ෂණය අවසානයේ මගෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත්තේය. පසුව නැවතත් අධිකරණ වෛද්‍ය අධිකාරීගෙන් වෛද්‍ය වාර්තාවක් ලබාගත් පසුව 2009 වසරේ 09 වෙනි මස 29 වෙනි දින මාව අලුත් කඩේ පිහිටි අධිකරණයේ විනිසුරු ඉදිරියේ පෙනී සිටීමට සැළැස්වීය. විනිසුරුගේ නියෝගයට අනුව මාව වැලිකඩ සිරගෙදරට යැවීය. ඒ අනුව වැලිකඩ සිරගෙදර කාන්තා අංශයෙහි මගේ සිර දඬුවම දීර්ඝ වන්නට විය.

මා වැලිකඩ සිරගෙදරට ගෙන යන මොහොතේ රාත්‍රී හත පසුවී තිබුණි. එදින නඩු සඳහා උසාවියට රැගෙන යන අයත්, අලුත් රැදවියන්ද වශයෙන් දහයකට අධික ප්‍රමාණයක් අලුත්කඩේ උසාවියේ සිට වැලිකඩ සිරගෙදරට ගෙන ගියේය. සී.අයි.ඩී. භාරයේ සිටි සිව් මසක කාලය තුළ මට සිංහල භාෂාවේ වචන කිහිපයක් හුරු වූවා මිස තවත් අයෙකු සමඟ කතා බහ කළ හැකි තරමට මම සිංහල දැන සිටියේ නැත. එදින උසාවියේ සිට සිරගෙදර රැගෙන ආ සියලුම කාන්තාවෝ සිංහල අය වූහ. බන්ධනාගාරය නමින් වූ නාම පුවරුව සහිතව ජනේලවලට කම්බි දැල් ගසා තිබුණ නිල් පැහැ බස් රථය වැලිකඩ සිරගෙදරට ඇතුල් විය. එහි ආරම්භයේ වූයේ සිරගෙදර ප්‍රධාන කොටසයි. බොහෝ විට සියලු දෙනාම ලියාපදිංචි කිරීම එම ස්ථානයෙහි දී සිදු කෙරෙයි. පිරිමි අංශයේ දහස් ගණන් රදවා තබාගෙන ඇති බව දක්නට ලැබුණි. දණ්ඩනයට ලක්වූ සිරකරුවෝ සුදු ඇඳුමින් උන්හ. අපව රැගෙන ආ බස් රථයෙහි ද පිරිමි අය කිහිප දෙනෙක් වූහ. දුම්කොල ගඳ සහ ගංජා මතින් දෑස් ඇතුලට ගොස් සිටි පිරිමින්ට තනි තනිව මාංචු දමා ඒවා ලොකු දම්වැලකින් එකට එක් කර තිබුණි.